**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
Ministry of Education, Higher Education and Vocational Education - Piriven Education Division
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விப் பிரிவு

# අන්තර් පාරිවේණික සිසු නිපුණතා ඇගයීම - 2025

## දිස්ත්‍රික් වටය

**සියලු ම හිමිකම් ඇවිරිණි.** **All rights reserved.** அனைத்து உரிமைகளும் பாதுகாக்கப்பட்டவை.

**ජ්‍යේෂ්ඨ අංශය** | **පාලි භාෂා හා සාහිත්‍යඥානය** | **කාලය පැය - 03 යි.**

❖ **පළමු දෙවන** හා **තෙවන** ප්‍රශ්න ඇතුළු ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

01. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

I. ලක්දිව ප්‍රසිද්ධ පාලි ව්‍යාකරණ සම්ප්‍රදායන් දෙකක් ලියා දක්වන්න.
II. **'ත්‍යජ්ජ, තඤ්ඤෙව'** යන පද විසන්ධි කරන්න.
III. **"තුම්හ"** ශබ්දයේ පඤ්චමී විභක්ති බහු වචන රූප ලියන්න.
IV. **'වාසිට්ඨ, පාපතම'** යන තද්ධිත පද අයත් තද්ධිත ලියා ප්‍රත්‍යය වෙන් කරන්න.
V. තුමන්ත ක්‍රියා පද දෙකක් ලියන්න.
VI. පාලි දාඨාවංසයේ කතුවරයාගේ නම කුමක් ද?
VII. අභිධර්ම පිටකයට ලියවුණු ටීකාව කුමක් ද?
VIII. විශ්වයේ ප්‍රභවය පිළිබඳ අනාවරණය කෙරෙන දීඝනිකායාගත සූත්‍රය නම් කරන්න.
IX. කච්චායන ව්‍යාකරණයේ ඇති කප්ප ගණන කීයද?
X. පුග්ගලපඤ්ඤත්ති ප්‍රකරණය සඳහා ලියන ලද අටුවාව නම් කරන්න.

*(ලකුණු 2×10 = 20යි.)*

2. (I) පහත සඳහන් ගද්‍ය පද්‍ය කොටස් සිංහලට නගන්නට.

පුන ච පරං භික්ඛවේ කාමහේතු කාමනිදානං කාමාධිකරණං කාමානමේව හේතු කායෙන දුච්චරිතං චරන්ති. වාචාය දුච්චරිතං චරන්ති. මනසා දුච්චරිතං චරන්ති. තෙ කායෙන දුච්චරිතං චරිත්වා, වාචාය දුච්චරිතං චරිත්වා, මනසා දුච්චරිතං චරිත්වා, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප්පජ්ජන්ති. අයම්පි භික්ඛවේ කාමානං ආදීනවො සම්පරායිකො දුක්ඛක්ඛන්ධො කාමහේතු කාමනිදානං කාමාධිකරණං කාමානමේව හේතු.

(මජ්ඣිම නිකාය - මහා දුක්ඛක්ඛන්ධ සූත්‍රය.)

(II)

බද්ධා හි භිසි සුසඞ්ඛතා - තිණ්ණො පාරගතො විනෙය්‍ය ඔඝං
අත්ථො භිසියා න විජ්ජති - අථ චෙ පත්ථයසි පවස්ස දෙව.

ගොපී මම අස්සවා අලොලා - දීඝරත්තං සංවාසියා මනාපා
තස්ස න සුණාමි කිඤ්චි පාපං - අථ චෙ පත්ථයසි පවස්ස දෙව.

චිත්තං මම අස්සවං විමුත්තං - දීඝරත්තං පරිභාවිතං සුදන්තං
පාපං පන මෙ න විජ්ජති - අථ චෙ පත්ථයසි පවස්ස දෙව.

අත්තවෙතනභතොහමස්මි - පුත්තා ච මෙ සමානියා අරොගා
තෙසං න සුණාමි කිඤ්චි පාපං - අථ චෙ පත්ථයසි පවස්ස දෙව.

(සුත්ත නිපාතය - ධනිය සූත්‍රය.)

*(ලකුණු 10+10 = 20යි.)*

3. පහත සඳහන් කච්චායන සූත්‍රවල අර්ථ දක්වා නිදසුන් 02 බැගින් සපයන්න.

I. වග්ගේඝෝසාඝෝසානං තතිය පඨමා
II. වා පරෝ අසරූපා
III. යමේදන්තස්සාදේසෝ
IV. දෝධස්සච
V. ලෝපඤ්ච තත්‍රාකාරෝ.

*(ලකුණු 4× 5 = 20යි.)*

4. (i) තතියා විභත්ති කාරක ප්‍රයෝග නිදසුන් සහිතව ලියා දක්වන්න.

(ii) බහුබ්බීහි සමාසයේ ප්‍රභේද පහක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

*(ලකුණු 10× 2 = 20යි.)*

5. (i) විනය පිටකයට අයත් ග්‍රන්ථ ලියා විනය පැනවීමේ මූලික අරමුණු කෙටියෙන් පහදන්න.

(ii) භික්ෂු ආචාරධර්ම ප්‍රවර්ධනයෙහිලා සේඛියාවල උපයෝගීතාව පෙන්වා දෙන්න.

*(ලකුණු 10× 2 = 20යි.)*

6. (i) විදේශීය පාලි උගතෙක් වන රීස් ඩේවිඩ්ස් මහතාගෙන් පාලි භාෂාව හා සාහිත්‍යය පෝෂණයෙහිලා සිදු වූ සේවාව පෙන්වා දෙන්න.

(ii) ලක්දිව රචිත පාලි වංස කතා දෙකක් වන පාලි ථූපවංසය හා දාඨාවංසයේ කර්තෘ අර්ථ පංචකය සඳහන් කරන්න.

*(ලකුණු 10× 2 = 20යි.)*

7. (i) සුබෝධාලංකාරයට අනුව කාව්‍ය දෝෂ වර්ග තුනකි. ඉන් ඔබ කැමති කාව්‍ය දෝෂ වර්ගයක් ගෙන උදාහරණ සහිතව කෙටියෙන් පහදන්න.

(ii) පාලි ඡන්දස් ශාස්ත්‍රයෙහි එන අට ගණ ප්‍රස්තාර කොට දක්වා සුබ අසුබ ගණ වෙන් කොට දක්වන්න.

*(ලකුණු 10× 2 = 20යි.)*

* * *